<u>තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය.</u>

1. <u>මූල්‍ය ප්‍රකාශන.</u>

1.1 <u>තත්ත්වාගණනය කළ මතය.</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු .</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) සම්පූර්ණ වශයෙන් ක්ෂයවී ඇති නමුත් අඛණ්ඩව භාවිතයේ පවතින රු.7,491,247 ක් වූ වත්කම් අයිතම 04 ක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.4,900,000 ක් වූ මෝටර් රථයක් ගිණුම් ප්‍රකාශවලට ඇතුළත්ව නොතිබුණු අතර ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදනද සලසා නොතිබුණි.

1.2.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි භාණ්ඩාගාර තැන්පත් ලෙස දක්වා ඇති රු.73,920,691 ක ශේෂය පිළිබඳ කිසිදු ලිඛිත සාක්ෂයක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) අධිකාරිය විසින් ඒකාබද්ධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා බැංකු 2 ක් වෙත සපයන ලද රුපියල් මිලියන 44.5 ක් හා රුපියල් මිලියන 193.2 ක් වූ අරමුදල් වලින් එම බැංකු විසින් ලබා දී තිබූ ණය මුදල් හා ශේෂයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 1.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරුණු ලැබේ.

| නිති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|
| (අ). ආයතන සංග්‍රහය. | |
| (i). iv වන පරිච්ඡේදයෙ 5.8වගන්තිය සහ 2004 දෙසැම්බර් 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය | 2001 ජනවාරි 15 දින දත්ත සැකසුම් ක්‍රියාකරු තනතුරට පත්කරන ලද නිළධාරිනිය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබියදී 2006 මැයි 09 දින සිට කළමණාකරණ සහකාර II පන්තියට අන්තර්ග්‍රහණය කර වැටුප් වර්ධක 12 ක් උපයාගත් පියවරක වැටුප පිහිටුවා 2009 නොවැම්බර් 16 දින සේවයේ ස්ථිර කර තිබුණි. |
| (ii). xiv පරිච්ඡේදයෙ 1.3 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සංයුක්ත දීමනා ලෙස සලකන්නේ නවාතැන් සහ යැපීම් වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම වශයෙන් ගෙවන මුදල් වේ. අධිකාරියේ නිළධාරින් ක්ෂේත්‍ර රාජකාරි වල නිරතවීමේදී ඒ සඳහා නවාතැන්, ආහාරපාන සඳහා රු.460,863 ක මුදල් ලබාගෙන තිබූ අතර ඊට අතිරේකව එම ගමන් වෙනුවෙන් රු.86,857 ක සංයුක්ත දීමනාද ලබාගෙන තිබුණි. |
| (iii).xxiv පරිච්ඡේදයේ 11.1 වගන්තිය සහ 2005 මාර්තු 31 දිනැති 08/2005 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපල ඇප වශයෙන් තබා මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලක් බේරුම් කිරීම සඳහා ණයක් ලබාගැනීමට ඉල්ලුම් කර තිබූ නිළධාරිනියකට රු.987,600 ක දේපල ණය මුදලක් අනුමත කර ගෙවා තිබුණි. |
| (ආ)1994 ජුනි 14 දිනැති 95 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන ඡේදය | විවිධ කාර්ය මණ්ඩල ශ්‍රේණි වලට රාජකාරි ගමන් සඳහා රු.10,500 ක විශේෂ දීමනා ගෙවීම් කර තිබුණද, ඊට භාණ්ඩාගාර අනුමැතිය ලබා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් වලින් රු.1,283,017 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,217,335 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,500,352

ක් වූ පිරිහීම සඳහා ආදායම් රු.11,301,520 ක් සහ වන්දි ගෙවීම් රු.6,329,003 ක් අඩුවීම සහ පරිපාලන වියදම් රු.527,835 ක් වැඩිවීම බලපා තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය.</u>

3.1. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා.</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ අනතුරට පත්වූ වාහනය වෙනුවෙන් ලැබිය යුතු රු.44,300 ක වන්දි අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම උදෙසා නිවාස සංවර්ධන අධිකාරිය වෙත දී තිබූ මුදලින් ගිවිසුම් කාල සීමාව අවසන්ව තිබුණ ද අයවීමට ඇති රුපියල් මිලියන 124.3 ක සහ ඊට අදාල පොලිය අය කරගෙන නොතිබුණි.

3.2 <u>අරමුදල් ඌන උපයෝජනය.</u>

අධිකාරිය ආයෝජනය කර තිබූ රු.70,500,000 ක් ආපසු ලබාගෙන ස්වයං රැකියා හා නව නිවාස ණය ලබාදීම සඳහා රු.46,989,000 ක් නැවත ආයෝජනය කර ඇතත්, ඉතිරි රු.23,511,000 ක් කිසිදු ආයෝජනයක නොයොදා මාස 2 1/2 ක් අත රඳවාගෙන තිබුණි.

3.3 <u>සේවක පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම.</u>

සේවක පාර්තෝෂිත වශයෙන් වෙන්කර තිබූ රු.3,349,943 ක අරමුදලක් ගොඩනැගීම සඳහා ආයෝජනය කර නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය.</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය.</u>

අධිකාරියේ සියළු ගනදෙනු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 <u>අයවැය පාලනය.</u>

අයවැයගත හා සත්‍ය වියදම් අතර සියයට 3 සිට සියයට 3184 දක්වා විචලනයන් නිරීක්ෂණය වයෙන් අයවැය ලේඛණය ඵලදායී මුල්‍ය කළමනාකරණ පාලන ඒකකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලන.</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල කළ යුතුවේ.

(අ). ස්ථාවර වත්කම්

(ආ). අයවැය පාලනය.

(ඇ). නිවාස ආධාර ව්‍යාපෘති

(ඈ). වන්දි ගෙවීම්.